## පළමුවැනි පරිශිෂ්ටය

(අ) ලංකා පාර්ලිමේන්තුව විසින් 1965 දී පනවන ලද, ප්‍රධාන නීති වලින් උපුටා ගත් මහ බැංකුවේ සහ බැංකු සංස්ථාවල කටයුතු හා ගනුදෙනු වලට අදාළ, කොටස්.

(ආ) 1965 දී මුදල් මණ්ඩලය විසින් සකස් කර ගන්නා ලද ප්‍රධාන පාලන විධිවිධාන.

**අ - ලංකා පාර්ලිමේන්තුව විසින් 1965 දී පනවන ලද, ප්‍රධාන නීති වලින් උපුටාගත්, මහ බැංකුවේ සහ බැංකු ආයතන වල කටයුතු හා ගනුදෙනු වලට අදාල කොටස්.**

1965 අංක: **7** දරන විසර්ජන පනත

1965 - 66 මුදල් වර්ෂයේ සේවා සඳහා ද, එවැනි සේවා සඳහා ලංකාව තුළින් හෝ පිටතින් හෝ ණය ලබා ගැනීමට බලය පැවරීම සඳහා ද, එම මුදල් වර්ෂය තුළ රජයේ සමහර කටයුතු සම්බන්ධයෙන්, මුදල් වෙන්කිරීම සඳහාද, එම මුදල් වර්ෂය තුළ එවැනි කටයුතු සඳහා වියදම් කිරීම සඳහාද, ලංකාවේ ඒකාබද්ධ අරමුලින්ද හෝ රජයේ හෝ රජය විසින් සුදුස්සක් කළ හැකි වෙනත් අරමුදලකින් හෝ මුදල් වලින් හෝ අත්තිකාරම් වශයෙන් ගෙවීමටද, එම මුදල් එකී ඒකාබද්ධ අරමුදලට නැවත ගෙවීමට ඉඩ සැලසීමටද, ඉහත කී කටයුතු වලට සම්බන්ධිතව හෝ ආනුෂං-ගිකව හෝ ඇති කරුණු සඳහා ඉඩ සැලසීමටද, බලය පැවරෙන පනතකි.

**(සම්මත වූ දිනය: 1965 සැප්තැම්බර් 30)**

**1.** මේ පනත 1965 අංක. **7** දරන විසර්ජන පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

2. (i) කුමන හෝ වියදමක් සඳහා බලය පැවරෙන වෙනත් අනෙක් නීතියකට හානියක් නොවන පරිද්දෙන් 1965 ඔක්තෝබර් **1** වැනිදායින් පටන් ගෙන, 1966 සැප්තැම්බර් 30 වැනිදායින් අවසන්වන, මුදල් වර්ෂයේ සේවාවන් සඳහා තක්සේරු කරන ලද රජයේ වියදම වන රුපියල් දෙසිය විසි දෙකෝටි තිස් දෙලක්ෂ හැත්තෑතුන්දහස් අටසිය අසූඑකයි.

(අ) මෙයින් බලය පැවරෙන ගෙවීම්, ලංකාවේ ඒකාබද්ධ අරමුදලින් හෝ රජයේ හෝ රජය විසින් සුදුස්සක් කළ හැකි වෙනත් අනෙක් අරමුදලකින් හෝ මුදල් වලින්ද,

සහ

(ආ) ලංකාණ්ඩුව වෙනුවෙන් හෝ සඳහා හෝ ලංකාව තුළින් හෝ පිටතින් හෝ මුළු වශයන් රුපියල් කෝටි 62 කට නොවැඩිව ලබා ගැනීමට මෙයින් බලය පැවරෙන ණය වලින්ද, ලබා ගත යුතුය.

මෙහි මින් පෙර සඳහන් රුපියල් දෙසිය විසි දෙකෝටි තිස් දෙලක්ෂ හැත්තෑ තුන්දහස් අටසිය අසූ එක, මේ පනතෙහි පළමු වැනි උපලේඛනයෙහි නියමිත පරිදි වැය කළ යුතුය.

(2) මේ වගන්තියේ (1) වැනි උප වගන්තියේ විධිවිධාන ක්‍රියාත්මක වීමේ දී, රජය සඳහා හෝ වෙනුවෙන් හෝ ණය ගැනීම සඳහා බලය පැවරෙන වෙනත් කුමන හෝ ලිඛිත නීතියක විධිවිධාන වලට හානියක් නොවියයුතුය.

3. (1) මේ පනතේ දෙවැනි උප ලේඛනයේ **1** වැනි තීරුවෙහි නියමිත, එක් එක් කාර්යයන් සඳහා ii වැනි වගන්තියේ සඳහන් මුදල් වර්ෂය තුළ රජයේ ලැබීම්, ඒ ඒ කාර්යයන් සඳහා වෙන්වූ ගිණුමට බැර කළ යුතුයි. එහෙත්, එසේ බැර කරනු ලැබීම්, එම ලේඛනයෙහි **III** වැනි තීරුවෙහි අනුරූප සටහනේ, නියමිත උපරිම සීමාව, නොඉක්මවිය යුතුය. එවැනි උපරිම සීමාව ඉක්මවා එවැනි කාර්යයන් ගෙන් ලැබෙන ලැබීම් ලංකාවේ ඒකාබද්ධ අරමුදලට බැර කළ යුතුය.

(2) මෙහි 2 වැනි වගන්තියේ සඳහන් මුදල් වර්ෂය තුළ, මේ පනතෙහි, 2 වැනි උප ලේඛනයේ I වැනි තීරුවෙහි නියමිත, එක් එක් කාර්යය උඩ රජය විසින් කැරුන වියදම් එම මුදල් වර්ෂය තුළ එවැනි කාර්යයන් ගෙන් රජයට ලැබෙන ලැබීම් වලින් ගෙවිය යුතුය. එහෙත් එවැනි වියදම් එම උප ලේඛනයේ II වැනි තීරුවෙහි අනුරූප සටහනේ නියමිත උපරිම සීමාව නොඉක්ම විය යුතුයි.

(3) 2 වැනි වගන්තියේ සඳහන් මුදල් වර්ෂය අවසානයේ, මේ පනතේ දෙ වැනි උප ලේඛනයේ I වැනි තීරුවෙහි නියමිත කුමන කාර්යයක් හෝ සම්බන්ධ ඉතිරිව ඇති හර ශේෂය, උප ලේඛනයේ IV වැනි තීරුවෙහි අනුරූප සටහනේ නියමිත උපරිම සීමාව නො ඉක්මවිය යුතුය. එසේම, එම මුදල් වර්ෂය අවසානයේදී එකී කටයුත්ත සඳහා වූ මුළු වගකීම, එම උප ලේඛනයේ V වැනි තීරුවෙහි අනුරූප සටහනේ නියමිත උපරිම සීමාව නොඉක්මවිය යුතුය.

(4) 2 වැනි වගන්තියේ සඳහන් මුදල් වර්ෂය තුළ, ඕනෑම අවස්ථාවක මේ පනතේ දෙවැනි උප ලේඛනයේ I වැනි තීරුවෙහි, නියමිත කුමන හෝ කාර්යයකින් රජයට ලැබෙන ලැබීම් එවැනි කාර්යයන් සඳහා රජයෙන් කැරෙන වියදම් පියවීමට ප්‍රමාණවත් නොවන්නේ නම්, එවැනි වියදම් පියවීමට මුදල් ඇමති විසින් අවශ්‍ය යැයි හඟින ප්‍රමාණයන් විටින් විට ලංකාවේ ඒකාබද්ධ අරමුදලින් හෝ රජයේ හෝ රජයට සුදුස්සන් කළ හැකි වෙනත් අනෙක් අරමුදලකින් හෝ මුදල් වලින් අත්තිකාරම් වශයෙන් ගෙවිය යුතුයයි මුදල් ඇමති විසින් නියෝගයකින් විධාන කළ හැකිය. එහෙත්, එසේ අත්තිකාරම් වශයෙන් දෙන මුළු ප්‍රමාණය එම උපලේඛනයෙහි II වැනි තීරුවෙහි අනුරූප සටහනේ නියමිත උපරිම වැය ප්‍රමාණය නොඉක්මවිය යුතුය. එවැනි කාර්යයක් සඳහා අත්තිකාරම් වශයෙන් දෙන යම් මුදලක්, මුදල් ඇමති විසින් නියෝගය කින් විධාන කරන පිළිවෙලට ඒකාබද්ධ අරමුදලට නැවත ගෙවිය යුතුය.

(5) මේ පනතේ පළමුවැනි උප ලේඛනයේ විධිවිධානානුසාරයෙන්, අංක. 3 5 සහ 7 යන වැය ශීර්ෂ වලට හැර එම උපලේඛනයේ නියමිත අනෙක් ශීර්ෂයක් යටතේ දැක්වෙන වෙනත් වැය ශීර්ෂයකට, වෙන් කැරුන යම් මුදලක් වැය කොට නොමැති නම්, හා වැය කැරෙන ලෙසක් නොපෙනෙන්නේ නම්, භාණ්ඩාගාරයේ ලේකම්ගේ හෝ ඔහු විසින් බලය පවරා ඇති වෙනත් නිලධාරියකු ගේ හෝ නියෝගය අනුව, එම ශීර්ෂය යටතේවූ වෙනත් වැය ශීර්ෂයකට පැවරිය හැකිය.

(6) මේ පනතෙහි දෙවැනි උපලේඛනයේ II, වැනි III වැනි, IV වැනි හෝ V වැනි තීරු වල නියමිත උපරිම සීමාවන් රජයේ අනුමැතිය ඇතිව, මුදල් ඇමති විසින් නියෝග කිරීමෙන් වෙනස් කළ හැකිය. එවැනි කුමන හෝ නියෝගයක් එසේ ප්‍රකාශ කර ඇත්නම්, එහි නියම කළ හැකි එකී නියෝගය පැනවීමේ දිනට, පෙර දිනක සිට එකී නියෝගය ක්‍රියාත්මක වී ඇති බැව් සැලකිය යුතුය.

(7) මේ පනතෙහි දෙවැනි උපලේඛනයේ, උචිත තීරු වලට යම් කටයුත්තක් සහ එවැනි කටයුත්තකට සම්බන්ධ සියළුම හෝ කුමන හෝ උපරිම ප්‍රමාණයන් එකතු කොට, පාර්ලිමේන්තු යෝජනා සම්මුතියකින් සංශෝධනය කළ හැකිය.

**උප ලේඛන පිළිබඳ සටහන.**

මේ පනතේ පළමු වැනි උප ලේඛනයේ, 1965 ඔක්තෝබර් 1 වැනි දින සිට පටන් ගෙන, 1966 සැප්තැම්බර් 30 වැනිදයින් අවසන් වන මුදල් වර්ෂයේ පොදු සේවාවන් සඳහා ගෙවිය හැකි ප්‍රමාණයන් කොටස් කොට දක්වා ඇත. ඒ ඒ පොදු සේවා ශීර්ෂ යටතේ ඇස්තමේන්තු කර ඇති ප්‍රමාණය රුපියල් දෙසිය විසි දෙකෝටි තිස් දෙලක්ෂ හැත්තෑ තුන්දහස් අටසිය අසූ එකක් වෙයි.

මේ පනතේ දෙවැනි උප ලේඛනයෙන්, රජයේ කටයුතු ඒ ඒ දෙපාර්තමේන්තු යටතේ බෙදු ඒ ඒ ශීර්ෂ යටතේ ලැබිය හැකි උපරිම වියදම් සීමාව, රජයේ කටයුතු ගිණුම්වලට බැර වශයෙන් ලැබිය හැකි උපරිම සීමාව, රජයේ කටයුතු සඳහා හර වශයෙන් ලැබිය හැකි උපරිම සීමාව, සහ රජයේ කටයුතු සඳහා ලැබිය හැකි වග කීම්වල උපරිම සීමාව, දක්වා ඇත.

**1965 අංක 10 දරන මුදල් (විශෙෂ විධිවිධාන) පනත**

කළු තෙල් මෝටර් වාහන බද්ද, බැංකු හර බද්ද තාවකාලික වාස බද්ද සහ විනිමය බද්ද අය කළේ හෝ පනවා අය කර ගත්තේ යම් ලිඛිත නීතිවල විධිවිධාන යටතේ ද ඒ ලිඛිත නීතිවල ඊට අදාළ විධිවිධාන අවලංගු කරනු ලැබීමට සැලැස්වීම සඳහා වූ පනතකි.

**(සම්මත වූ දිනය: 1965 නොවැම්බර් 13)**

1. මෙම පනත 1965 අංක 10 දරන මුදල් (විශේෂ විධිවිධාන) පනත යනුවෙන් හැඳින්විය හැකි අතර-

(අ) මෙම පනත 1965 ඔක්තෝබර් මස පළමු වන දින හෝ ඊට පෙර පාර්ලිමේන්තු පනතක් බවට පත් වුවහොත්, එකී ඔක්තෝබර් මස පළමු වන දින ක්‍රියාත්මක විය යුතු, හෝ

(ආ) මෙම පනත එකී ඔක්තෝබර් මස පළමු වන දිනෙන් පසු යම් දිනක පාර්ලිමේන්තු පනතක් බවට පත් වුවහොත් එකී ඔක්තෝබර් මස පළමු වන දින ක්‍රියාත්මක වූ ලෙස සියලුම කාර්යයන් සඳහා සැලකිය යුතුය.

2. කළුතෙල් මෝටර් වාහන බදු ආඥා පනත 1966 ජනවාරි මස පළමු වන දින සිට මෙයින් අවලංගු කරනු ලැබේ.

3. 1957 අංක 42 දරන බැංකු හර බදු පනත මෙයින් අවලංගු කරනු ලැබ.

4. 1961 අංක 36 දරන තාවකාලික වාස බදු පනත මෙයින් අවලංගු කරනු ලැබේ.

5. 1963 අංක 11 දරන මුදල් පනතේ II වන කොටස මෙයින් අවලංගු කරනු ලැබේ.

## 1965 අංක 17 දරන නිවාඩු දින පනත

නිවාඩු ආඥාපනත අවලංගු කිරීම සඳහාත්, වෙනත් කරුණු අතර පෝය දිනයන් නිසි ලෙස පිළිගැනෙන අලුත් ප්‍රතිපත්ති සහ විධිවිධාන ඇතුළත් පනතක් එම ආඥාපනත වෙනුවට ඇති කිරීම සඳහාත්, එයට සම්බන්ධ හෝ ආනුෂංගික කරුණු සම්බන්ධයෙන් විධිවිධාන සැලසීම සඳහාත් වූ පනතකි.

1. මේ පනත 1965 අංක 17 දරන නිවාඩු පනත යනුවෙන් හැඳින්විය හැකි අතර ගැසට් පත්‍රයෙහි පළ කරනු ලබන ආඥාවක් මගින් ඇමතිවරයා විසින් නියම කරනු ලබන දිනයක ක්‍රියාත්මක විය යුතු ය.

2. සෑම ඉරු දිනයක් —

(අ) ලංකාවෙහි නො දිනයක් වශයෙන් පැවතීමට හේතු වූ යම් චාරිත්‍රයක්, ව්‍යවහාරයක් හෝ ලිඛිත නීතියක් ලංකාවෙහි නීතිය වශයෙන් වලංගු ව තිබීම සහ බලපැවැත්වීම කෙළවර විය යුතු බව සහ, ඒ අනුව හුදෙක් එසේ වලංගුව පැවැති හා බලපැවැත්වූ හෝ වලංගුව පැවති ලෙස හා බලපැවැත්වූ ලෙස සැලකෙන එවැනි චාරිත්‍රයක් හෝ ව්‍යවහාරයක් හෝ නීතියක් කරණකොට ගෙන කිසිදු ඉරු දිනයක් එවැනි නො දිනයක් නො විය යුතු බව හෝ එසේ තවදුරටත් නො පැවතිය යුතු බව ද;

(ආ) ලංකාවෙහි නිවාඩු දිනයක් වශයෙන් පැවැතීමට හේතු වූ යම් චාරිත්‍රයක් හෝ ව්‍යවහාරයක් හෝ ලිඛිත නීතියක් ලංකාවෙහි නීතිය වශයෙන් වලංගුව තිබීම සහ බලපැවැත්වීම කෙළවර විය යුතු බව සහ, ඒ අනුව, හුදෙක් එසේ වලංගුව පැවති හා බලපැවැත්වූ හෝ වලංගුව පැවති ලෙස හා බලපැවැත්වූ ලෙස සැලකෙන එවැනි චාරිත්‍රයක් හෝ ව්‍යවහාරයක් හෝ නීතියක් කරණකොට ගෙන කිසිදු ඉරු දිනයක් එවැනි නිවාඩු දිනයක් වශයෙන් පැවැත්වීම හෝ එසේ තවදුරටත් පවත්වාගෙන යෑම නො කළ යුතු බව ද;

(ඇ) ලංකාවේ බැංකුවල වැසීමේ නිවාඩු දිනයක් වශයෙන් පැවතීමට හේතු වූ යම් චාරිත්‍රයක් හෝ ව්‍යවහාරයක් හෝ ලිඛිත නීතියක් ලංකාවෙහි නීතිය වශයෙන් වලංගුව තිබීම සහ බලපැවැත්වීම කෙළවර විය යුතු බව සහ, ඒ අනුව, හුදෙක් එසේ වලංගුව පැවති හා බලපැවැත්වූ හෝ වලංගුව පැවති ලෙස හා බලපැවැත්වූ ලෙස සැලකෙන එවැනි චාරිත්‍රයක් හෝ ව්‍යවහාරයක් හෝ නීතියක් කරණකොට ගෙන කිසිදු ඉරු දිනයක් එවැනි වැසීමේ නිවාඩු දිනයක් වශයෙන් පැවැත්වීම හෝ එසේ තවදුරටත් පවත්වාගෙන යෑම නො කළ යුතු බව ද

මෙයින් ප්‍රකාශ කරනු ලැබේ.

3. සෑම පෝය දිනයක් —

(අ) රජයේ නිවාඩු දිනයක් විය යුතු බව, සහ

(ආ) බැංකු නිවාඩු දිනයක් විය යුතු බව

මෙයින් ප්‍රකාශ කරනු ලැබේ.

4. (1) පෝය දිනවලට අතිරේක ව, පහත සඳහන් දිනයන් ද රජයේ නිවාඩු දිනයන් විය යුතු ය :-

(අ) (2) සහ (3) යන උපවගන්තිවල විධිවිධානවලට යටත් ව, මේ පනතට යා කොට ඇති පළමුවන උපලේඛනයේ තත්කාලයේ නිශ්චිත ව දක්වා ඇති එක් එක් දිනය; සහ

(ආ) 13 (1) (අ) වන වගන්තිය යටතේ ඇමතිවරයා විසින් පනවනු ලැබ තත්කාලයෙහි වලංගුව පවතින ආඥාවකට සම්බන්ධවූ වෙන යම් දිනයක්.

(2) 13 (1) (ආ) වන වගන්තිය යටතේ ඇමතිවරයා විසින් පනවනු ලැබූ ආඥාවක් වලංගු ව ඇතිතාක් දුරට සහ ඒ තාක් දුරට පමණක් (1) (අ) වන උප වගන්තියෙහි සඳහන් වූත් එම ආඥාවෙහි නිශ්චිත ව දක්වා ඇත්තාවූත් යම් දිනයක් වෙනුවෙන් රජයේ නිවාඩු දිනයක් විය යුතු දිනය වශයෙන් එම ආඥාවෙහි නිශ්චිතව දක්වා ඇති යම් දිනයක්, එම ආඥාවෙහි නියමයන් අනුව, එසේ සඳහන් වූ සහ නිශ්චිතව දක්වන ලද දිනය වෙනුවෙන් රජයේ නිවාඩු දිනයක් විය යුතුය; තවද එම උප වගන්තියෙහි විධිවිධාන මේ උපවගන්තියෙහි ඉහත දැක්වූ විධිවිධානවලට යටත් ව කියවා තේරුම් ගත යුතු ය.

(3) යම් රජයේ නිලයක් හෝ රජයේ දෙපාර්තමේන්තුවක් සම්බන්ධයෙන් 8 වන වගන්තිය යටතේ ඇමතිවරයා විසින් පනවනු ලැබූ ආඥාවක් වලංගු ව ඇති තාක් දුරට සහ ඒ තාක් දුරට පමණක්, ඒ නිලයේ හෝ එම නිලය දරන යම් තැනැත්තකුගේ හෝ එම දෙපාර්තමේන්තුවෙහි යම් සාමාජිකයකුගේ කාර්‍ය්‍යයන් සඳහා හෝ එම නිලය, දෙපාර්තමේන්තුව හෝ තැනැත්තා සම්බන්ධයෙන්, (1) (අ) වන උපවගන්තියෙහි සඳහන් වූත් එම ආඥාවෙහි නිශ්චිත ව දක්වා ඇත්තා වූත් දිනයන් පමණක් රජයේ නිවාඩු දිනයන් විය යුතු ය; තවද එම උපවගන්තියෙහි විධිවිධාන මේ උපවගන්තියෙහි ඉහත කී විධිවිධානවලට යටත් ව වලංගු ද බලපවත්වනු ද විය යුතු ය.

5. (1) පෝය දිනවලට අමතරව පහත සඳහන් දිනයන් ද බැංකු නිවාඩු දිනයන් විය යුතු ය:-

(අ) (2) වන උපවගන්තියේ විධිවිධානවලට යටත් ව, මේ පනතට යාකොට ඇති දෙවන උපලේඛනයේ තත්කාලයෙහි නිශ්චිත ව දක්වා ඇති එක් එක් දිනය; සහ

(ආ) 14 (1) (අ) වන වගන්තිය යටතේ ඇමතිවරයා විසින් පනවනු ලැබ තත්කාලයෙහි වලංගුව පවතින ආඥාවකට සම්බන්ධ වූ වෙන යම් දිනයක්.

(2) 14 (1) (ආ) වන වගන්තිය යටතේ ඇමතිවරයා විසින් පනවනු ලැබූ ආඥාවක් වලංගු ව ඇති තාක් දුරට සහ ඒ තාක් දුරට පමණක් (1) (අ) වන උප වගන්තියෙහි සඳහන් වූත් එම ආඥාවෙහි නිශ්චිත ව දක්වා ඇත්තාවූත් යම් දිනයක් වෙනුවෙන් බැංකු නිවාඩු දිනයක් විය යුතු දිනය වශයෙන් එම ආඥාවෙහි නිශ්චිත ව දක්වා ඇති යම් දිනයක් එම ආඥාවෙහි නියමයන් අනුව, එසේ සඳහන් වූ සහ නිශ්චිත ව දක්වන ලද දිනය වෙනුවට බැංකු නිවාඩු දිනයක් විය යුතු ය; තව ද එම උපවගන්තියෙහි විධිවිධාන මේ උපවගන්තියෙහි ඉහත කී විධිවිධාන-වලට යටත් ව කියවා තේරුම් ගත යුතු ය.

6. සෑම රජයේ නිවාඩු දිනයක්—

(අ) නොදිනයක් විය යුතු ය; තවද

(ආ) නිවාඩු දිනයක් වශයෙන් පැවැත්විය යුතු ය.

7. සෑම බැංකු නිවාඩු දිනයක් සෑම බැංකුවක ම වැසීමේ නිවාඩු දිනයක් වශයෙන් පැවැත්විය යුතු ය.

8. මහජනයාට සැලකිය යුතු අපහසුකම් ඇතිවීම හෝ ජන ජීවිතයට අත්‍යවශ්‍ය සේවා අවුල් වියවුල්වීම වැළැක්වීමේ කාර්‍ය්‍ය සඳහා, යම් රජයේ නිලයකට අයත් හෝ රජයේ දෙපාර්තමේන්තුවකට අයත් කර්තව්‍යයන් පිළිබඳ පාලනයෙහි වගකීම පැවරී ඇති ඇමතිවරයාගේ එකඟත්වය ඇතිව ඇමතිවරයා විසින් ගැසට් පත්‍රයෙහි පළ කරනු ලබන ආඥාවක් මගින් එම නිලයෙහි හෝ දෙපාර්තමේන්තු-වෙහි හෝ එම නිලය දරන යම් තැනැත්තකුගේ හෝ එම දෙපාර්තමේන්තුවෙහි යම් සාමාජිකයකුගේ කාර්‍ය්‍යයන් සඳහා හෝ ඒ නිලය, දෙපාර්තමේන්තුව හෝ තැනැත්තා සම්බන්ධයෙන් පෝය දිනය රජයේ නිවාඩු දිනයක් නො විය යුතු යයි ද, තවද ඊට අමතර ව, මේ පනතෙහි එයට පටහැනි ව කුමක් සඳහන් ව ඇතත්, මේ පනතට යා කොට ඇති පළමුවන උපලේඛනයේ තත්කාලයෙහි නිශ්චිත ව සඳහන් ව ඇත්තා වූ සහ එම ආඥාවෙහි නිශ්චිත ව දක්වා ඇත්තා වූත් දිනයන් පමණක් රජයේ නිවාඩු දිනයන් විය යුතු යයි ද කලින් කල ප්‍රකාශ කළ හැකි ය. ඒ ආඥාව එය ගැසට් පත්‍රයෙහි පළ කරනු ලැබූ දිනයෙහි හෝ එහි නිශ්චිත ව සඳහන් කරනු ලැබිය හැකි පසු දිනයක වලංගු විය යුතු ය. ඒ ආඥාව සංශෝධනය කිරීම, අවලංගු කිරීම, හෝ ඒ වෙනුවට අනෙකක් යෙදීම එබඳුම එකඟත්වය ඇති ව කරනු ලබන එවැනි ම ආඥාවක් මගින් කළ හැකි ය.

9. (1) පෝය දිනයක කරන ලෙස යම් තැනැත්තෙකුට බල කළ නොහැකි යම් ක්‍රියාවක් හෝ යම් ගෙවීමක් බැංකු නිවාඩු දිනයක කරන ලෙස ඒ තැනැත්තාට බල කළ නො හැකි විය යුතු අතර, ඒ අනුව, ඒ ගෙවීම කිරීමට හෝ ඒ ක්‍රියාව කිරීමට ඇති බැඳීම ඒ බැංකු නිවාඩු දිනයට ඉක්බිතිවම පැමිණෙන දිනය පෝය දිනයක් හෝ බැංකු නිවාඩු දිනයක් නො වුවහොත් ඒ දිනයට අදාළ විය යුතු ය; තව ද ඒ ඉක්බිතිව පැමිණෙන දිනයෙහි ඒ ගෙවීම කිරීම හෝ ඒ ක්‍රියාව කිරීම ඒ බැංකු නිවාඩු දිනයෙහි ඒ ගෙවීම කිරීමට හෝ ඒ ක්‍රියාව කිරීමට සමාන ලෙස සියලු කාර්‍ය්‍යයන් සඳහා සැලකිය යුතු ය.

(2) මේ වගන්තියෙහි ඉහත කී විධිවිධානවල කිසිවක් විනිමය බිල් පත්‍ර හෝ පොරොන්දු නෝට්ටු සම්බන්ධයෙන් තත්කාලයෙහි වලංගු නීතිය කෙරෙහි බල නො පෑ යුතු අතර රජයේ නිවාඩු දිනයක් නො වන බැංකු නිවාඩු දිනයක අධිකරණයක දී හෝ රජයේ කාර්‍ය්‍යාලයක දී කළ යුතු යම් ගෙවීමකට හෝ ක්‍රියාවකට ද ඒ විධිවිධානවල කිසිවක් අදාළ නො විය යුතු ය.

10. ඇමතිවරයා විසින් ගැසට් පත්‍රයෙහි පළ කරනු ලබන ආඥාවක් මගින් එම ආඥාවෙහි නිශ්චිත ව දක්වෙන යම් වර්ෂයක් සම්බන්ධයෙන් එසේම නිශ්චිත ව දක්වෙන ඒ වර්ෂයේ එක් එක් මාසයේ එක් එක් දිනය මේ පනතෙහි කාර්‍ය්‍යයන් සඳහා පෝය දිනයන් විය යුතු යයි කලින් කල ප්‍රකාශ කළ හැකි ය. එවැනි යම් ආඥාවක් එය ගැසට් පත්‍රයෙහි පළ කරනු ලබන දිනයෙහි හෝ එහි නිශ්චිත ව සඳහන් කරනු ලැබිය හැකි පසු දිනයක වලංගු විය යුතු ය. ඒ ආඥාව සංශෝධනය කිරීම, අවලංගු කිරීම හෝ ඒ වෙනුවට අනෙකක් යෙදීම එවැනි ම වූ ආඥාවක් මගින් කළ හැකි ය.

11. (1)(අ) මේ පනතේ විධිවිධානවල හා ප්‍රතිපත්තිවල අන්තර්ගත අළුත් නිවාඩු ක්‍රමයේ ප්‍රතිලාභ හා ප්‍රයෝජන කිසියම් විශේෂ පන්තියකට හෝ හැඳින්වීම-කට හෝ අයත් සේවකයන් විසින් භුක්ති විඳීමට හෝ එකී සේවකයන් සඳහා ව්‍යාප්ත කිරීමට හෝ හැකිවනු වස්, ඔවුන්ගේ සේවා නියුක්ති අණපනත් හා කොන්දේසි වල සමහර නැවත සකස් කිරීම් හා වෙනස්කම් ඇති කිරීම අවශ්‍ය මුත්,

එකී අණපනත් හා කොන්දේසි පාලනය කරන හෝ යටව පවතින, කිසියම් ලිඛිත නීතියක විධිවිධාන මේ පනත හැර සංශෝධනය කිරීමක් හෝ සුළු වශයෙන් වෙනස් කිරීමක් හෝ නො කොට වෙනස්කම් හෝ නැවත සකස් කිරීම් ක්‍රියාත්මක කළ නොහැකිවූ විට, ඇමතිවරයා විසින්, එකී කාර්‍යය සඳහා අවශ්‍ය විය හැකි ප්‍රමාණයට හෝ ආකාරයට කිසියම් ලිඛිත නීතියක් සංශෝධනය කිරීමට හෝ සුළු වශයෙන් වෙනස් කිරීමට හෝ මේ පනත යටතේ නියෝග පැනවිය හැකි වන මුත්, විශේෂ වශයෙන් පඩිපාලක සභා ආඥාපනත, සාප්පු හා කාර්යාල සේවක (සේවා නියුක්ති හා පාරිශ්‍රමික නියෝග) පනත සහ කර්මාන්ත ශාලා ආඥාපනත එසේ සංශෝධනය කිරීමේදී හෝ සුළු වශයෙන් වෙනස් කිරීමේදී හෝ මේ ජේදයේ ඉහතින් සඳහන් කළ විධිවිධාන මගින් පැවරෙන බලතල වල සාමාන්‍යත්වයට හානියක් නොවිය යුතුය. එසේ පනවන හෝ ක්‍රියාත්මක කරවන නැවත සකස් කිරීම් හා වෙනස්කම්, පිළිබඳව තීරණය කිරීමේදී, සේවායෝජකයන් හා සේවකයන් අතර දැනට පවත්නා අයිතිවාසිකම් හා ගැතිකම් පිළිබඳවත්, මෙකී නැවත වෙනස් කිරීම් හා වෙනස්කම් නිසා ලංකාවේ ආර්ථික ක්‍රියාකාරිත්වයේ සාමාන්‍ය හැඩ ගැස්මට හා අනෙකුත් රටවල් සමග පවත්නා ලංකාවේ වෙළෙඳාමට විෂම බලපෑම් ඇති නොවීමට වග බලා ගැනීම හිතකර බව පිළිබඳව විධිමත්ව සැලකිලිමත් විය යුතු ය.

(ආ) මේ උපවගන්තියේ (අ) ජේදයේ "සේවානියුක්ති අණපනත් හෝ කොන්දේසි" යන පාඨයට කාර්ය වේලාවන්, පාරිශ්‍රමිකය, අතිකාල ගෙවීම්, නිවාඩු දිනයන් සහ විවේක පැය හෝ දින ආදී කරුණු ඇතුළත් වේ.

(ඇ) අගමැතිවරයා විසින් කම්කරු විෂය හෝ කාර්ය පවරන ලද ඇමතිවරයාගේ පූර්ව එකගත්වය ඇතිව මිස, මේ උපවගන්තියේ ඉහත දැක්වුනු විධිවිධානවල සඳහන් වී ඇති කුමන කරුණක් සම්බන්ධයෙන් හෝ මේ පනත යටතේ ඇමතිවරයා විසින් රෙගුලාසි පැනවිය යුතු නොවේ.

(2) (අ) මේ පනතේ ප්‍රතිපත්ති හා විධිවිධාන සම්පූර්ණ බල සහිතව හා වලංගුව තිබීමට අවශ්‍ය විය හැකි, එබඳු කාර්ය හෝ කාර්යයන් සඳහා මේ පනත යටතේ ඇමතිවරයා විසින් රෙගුලාසි පැනවිය හැකිය.

(ආ) විශේෂයෙන් එහෙත්, මේ උපවගන්තියේ ඉහත දක්වන ලද විධිවිධානයන් මගින් පවරන ලද බලතලවල සාමාන්‍යත්වයට හානියක් නොවන පරිදි පහත දැක්වෙන කරුණු සියල්ලම හෝ ඉන් යම් කිසිවක් සඳහා හෝ සම්බන්ධයෙන් ඇමතිවරයා විසින් නියෝග පැනවිය හැකි ය.

(i) මේ පනත අදාල කිරීමට සහ ක්‍රියාත්මක කිරීමට සම්බන්ධවූත්, විශේෂ අවස්ථාවලට හෝ කරුණුවලට ගැලපෙන ලෙස මේ පනතෙහි විධිවිධාන වෙනස් කිරීම සහ අතිරේක විධිවිධාන පැනවීම අවශ්‍ය වන්නාවූත් සියලු කරුණු.

(ii) නිශ්චය කිරීම හෝ නැවත සකස් කිරීම සම්බන්ධයෙන් මේ පනත මගින් විධිවිධාන හෝ එලදායි විධිවිධාන පනවා නොමැති, රජයේ නිවාඩු හා බැංකු නිවාඩු පිළිබඳ යම් ප්‍රශ්නයකට හෝ කරුණකට අදාල හෝ ආනුෂංගික කරුණු නිශ්චය කිරීම හෝ නැවත සකස් කිරීම.

(iii) මේ පනතෙහි විධිවිධාන හා වෙන යම් ලිඛිත නීතියක් හා අතර යම් ඝට්ටනයක් හෝ ප්‍රතිවිරුද්ධතාවක් ඉවත් කිරීම හෝ නැවත සකස් කිරීම.

(iv) ඉහත කී කරුණුවලට සම්බන්ධ හෝ ආනුෂංගික වෙනත් සියලුම කරුණු.

(ආ) එවැනි නියෝගවල පරමාර්ථයන් මුදුන් පමුණුවා ගැනීම සඳහා අවශ්‍ය විය හැකි මේ පනතේ හෝ වෙන යම් ලිඛිත නීතියක ((1) වැනි උප වගන්තියේ සඳහන් කිසියම් ලිඛිත නීතියක් නොවන) එවැනි සියලු සංශෝධනවලට සුළු වශයෙන් වෙනස් කිරීම්වලට හෝ වෙනස්කිරීම්වලට මේ උපවගන්තියේ ඉහත දක්වන ලද විධිවිධාන යටතේ පනවන ලද නියෝගවලින් ඉඩ සැලැස්විය හැකිය.

(3) මේ පනත යටතේ පනවන ලද කිසියම් නියෝගයක් පොදු යෙදවීම සඳහා විය හැකි හෝ කිසියම් නිශ්චිත කාර්යයක් හෝ කාර්යයන්ට යෙදවිය හැකිය.

(4) මේ පනත යටතේ ඇමතිවරයා විසින් පනවන ලද රෙගුලාසියක්, උත්තර මන්ත්‍රී මංඩලය හා නියෝජිත මන්ත්‍රී මංඩලය මගින් අනුමැතිය ලබන තෙක් සහ එවැනි අනුමැතියක නිවේදනයක් ගැසට් පත්‍රයේ පළ කැරෙන තෙක් බල නො පැවැත්විය යුතු ය.

(5) මේ පනත යටතේ ඇමතිවරයා විසින් පනවනු ලබන සෑම නියෝගයක්ම, උපවගන්තියේ (4) සලසා ඇති පරිදි එම නියෝගය අනුමත කිරීම පිළිබඳ නිවේදනයන් ගැසට් පත්‍රයේ පළ කිරීමෙන් එය මෙහිදී පනවන ලද්දක් සේ වලංගුව පැවති හා බලපැවැත්වූ සේ සැලකිය යුතු ය.

12. (1) මෙම පනතේ පළමුවන උපවගන්තියට හෝ දෙවන උපවගන්තියට යම් දිනයක් එක් කිරීමෙන් හෝ යම් දිනයක් ඉන් ඉවත් කිරීමෙන් පළමු වන උපලේඛනය හෝ දෙවන උපලේඛනය කලින් කල සංශෝධනය කිරීම හෝ වෙනස් කිරීම හෝ, මෙම උපවගන්තියේ පෙරාතුව වූ විධිවිධාන යටතේ කරනු ලබන සියලු ම සංශෝධන හෝ වෙනස් කිරීම් ඇතුළත් උපලේඛනයක් ඒ වෙනුවට යොදවමින් එබඳු යම් උපලේඛනයක් කලින් කල ඉවත් කිරීම, ගැසට් පත්‍රයෙහි ප්‍රසිද්ධ කරනු ලබන ආඥාවක් මගින් ඇමතිවරයා විසින් කළ හැකි ය.

(2) (1) වන උපවගන්තිය යටතේ ඇමතිවරයා විසින් කරනු ලබන යම් ආඥාවක්, එය ගැසට් පත්‍රයෙහි ප්‍රසිද්ධ වීමේ දින හෝ එහි නිශ්චිත ව සඳහන් විය හැකි පසු දිනක ක්‍රියාත්මක විය යුතු ය. එබඳු යම් ආඥාවක් ඒ හා සමාන ආඥාවක් මගින් සංශෝධනය කිරීම හෝ අවලංගු කිරීම හෝ ඒ ආඥාව වෙනුවට අනෙකක් යෙදීම කළ හැකි ය.

13. (1) ඇමතිවරයා විසින්, මෙම පනතේ පළමුවන උපලේඛනය සංශෝධනය හෝ වෙනස් නො කර, ගැසට් පත්‍රයෙහි ප්‍රසිද්ධ කරනු ලබන ආඥාවක් මගින්

(අ) ඒ උපලේඛනයෙහි එවකට නිශ්චිත ව සඳහන් දිනයක් නො වන, ඒ ආඥාවෙහි නිශ්චිත ව සඳහන් විය හැකි යම් වර්ෂයකට අයත් යම් මාසයක යම් දිනයක්, එම උපලේඛනයෙහි එවකට නිශ්චිත ව සඳහන් දිනවලට අතිරේක වශයෙන් මෙම පනතේ කාර්යයන් සඳහා රජයේ නිවාඩු දිනයක් විය යුතු යයි; හෝ

(ආ) ඒ උපලේඛනයෙහි එවකට නිශ්චිත ව සඳහන් යම් දිනයක් වෙනුවට, ඒ ආඥාවෙහි නිශ්චිත ව සඳහන් විය හැකි, යම් වර්ෂයකට අයත් යම් මාසයක යම් දිනයක් මෙම පනතේ කාර්යයන් සඳහා රජයේ නිවාඩු දිනයක් විය යුතු යයි

කලින් කල ප්‍රකාශ කළ හැකි ය.

(2) යම් දිනයක් මෙම පනතේ කාර්යයන් සඳහා රජයේ නිවාඩු දිනයක් ලෙස ප්‍රකාශ කරමින් (1) වන උපවගන්තිය යටතේ ඇමතිවරයා විසින් කරනු ලබන යම් ආඥාවක්, එය ගැසට් පත්‍රයෙහි ප්‍රසිද්ධ කිරීමේ දින හෝ එහි නිශ්චිත ව සඳහන් විය හැකි පසු දිනක ක්‍රියාත්මක විය යුතු අතර ඒ දිනයට ඉක්බිතිවම එන දින දී එහි ක්‍රියාත්මක වීම අවසන් විය යුතු ය.

14. (1) ඇමතිවරයා විසින්, මෙම පනතේ දෙවන උපලේඛනය සංශෝධනය හෝ වෙනස් නො කර ගැසට් පත්‍රයෙහි ප්‍රසිද්ධ කරනු ලබන ආඥාවක් මගින්—

(අ) ඒ උපලේඛනයෙහි එවකට නිශ්චිත ව සඳහන් දිනයන් නො වන, ඒ ආඥාවෙහි නිශ්චිත ව සඳහන් විය හැකි යම් වර්ෂයකට අයත් යම් මාසයක යම් දිනයක්, එම උපලේඛනයෙහි එවකට නිශ්චිත ව සඳහන් දිනවලට අතිරේක වශයෙන් මෙම පනතේ කාර්යයන් සඳහා බැංකු නිවාඩු දිනයක් විය යුතු යයි; හෝ

(ආ) ඒ උපලේඛනයෙහි එවකට නිශ්චිත ව සඳහන් යම් දිනයක් වෙනුවට, ඒ ආඥාවෙහි නිශ්චිත ව සඳහන් විය හැකි, යම් වර්ෂයකට අයත් යම් මාසයක යම් දිනයක් බැංකු නිවාඩු දිනයක් විය යුතු යයි

කලින් කල ප්‍රකාශ කළ හැකි ය.

(2) යම් දිනයක් මෙම පනතේ කාර්යයන් සඳහා බැංකු නිවාඩු දිනයක් ලෙස ප්‍රකාශ කරමින් (1) වන උපවගන්තිය යටතේ ඇමතිවරයා විසින් කරනු ලබන යම් ආඥාවක්, එය ගැසට් පත්‍රයෙහි ප්‍රසිද්ධ කිරීමේ දින හෝ එහි නිශ්චිත ව සඳහන් විය හැකි පසු දිනක ක්‍රියාත්මක විය යුතු අතර ඒ දිනයට ඉක්බිති ව ම එන දින දී එහි ක්‍රියාත්මක වීම අවසන් විය යුතු ය.

15. නිවාඩු ආඥාපනත මෙයින් අවලංගු කරනු ලැබේ.

16. පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වුවහොත් මිස—

"බැංකු නිවාඩු දිනය" යන්නෙන් මෙම පනතේ විධිවිධාන ක්‍රියාත්මක වීමේ ප්‍රකාර බැංකු නිවාඩු දිනයක් වන දිනයක් අදහස් කෙරේ;

"පෝය දිනය" යන්නෙන් 10 වන වගන්තිය යටතේ ඇමතිවරයා විසින් පනවනු ලැබ එවකට වලංගු ව පවත්නා යම් ආඥාවක් මගින් පෝය දිනයක් ලෙස ප්‍රකාශ කරනු ලැබූ යම් දිනයක් අදහස් කෙරේ.

"රජයේ නිවාඩු දිනය" යන්නෙන් මෙම පනතේ විධිවිධාන ක්‍රියාත්මක වීමේ ප්‍රකාර රජයේ නිවාඩු දිනයක් වන යම් දිනයක් අදහස් කෙරේ.

## පළමුවන උපලේඛනය
### රජයේ නිවාඩු දවස්

ජාතික වීරයන්ගේ දිනය (ජනවාරි 1 වන දින)
දෙමළ තයි පොංගල් දිනය
රමසාන් දිනය.
නිදහස් සමරු දිනය (පෙබරවාරි 4 වන දින)
මහා සිව රාත්‍රි දිනය.
සිංහල සහ දෙමළ අලුත් අවුරුදු දිනට පෙරාතුව වූ දිනය.
සිංහල සහ දෙමළ අලුත් අවුරුදු දිනය.

මහ සිකුරාදා.
පාස්කු ඉරිදා.
මැයි දිනය (මැයි 1 වන දින)
වෙසක් මස පුන් පොහෝ දිනට පෙරාතුව ම වූ දිනය.
හජ්ජි උත්සව දිනය.
මොහමඩ් නබි නායක තුමාගේ උපන් දිනය.
දීපාවලී උත්සව දිනය.
නත්තල් දිනය.

දෙවන උපලේඛනය
බැංකු නිවාඩු දවස්

දෙමළ තයිපොංගල් දිනය
නිදහස් සමරු දිනය (පෙබරවාරි 4 වන දින).
සිංහල සහ දෙමළ අලුත් අවුරුදු දිනය.
මැයි දිනය (මැයි 1 වන දින)
මොහමඩ් නබි නායක තුමාගේ උපන් දිනය.
ජූනි 30 වන දිනය.
දීපාවලී උත්සව දිනය.
නත්තල් දිනය.
දෙසැම්බර් 31 වන දිනය.

## 1965 අංක 19 දරන ලංකා ඛනිජ තෙල් (විදේශික හිමිකම් පෑම්) වන්දි පනත

ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථා පනතෙහි විධිවිධාන යටතේ ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව වෙත සතු කරනු ලැබූ හෝ ඒ සඳහා අත්කර ගනු ලැබූ, විදේශික-සතු ඛනිජ තෙල් සමාගම් වල ඇතැම් වත්කම් සඳහා ඒ සමාගම් වලට ගෙවිය යුතු වන්දිය සම්බන්ධයෙන් රජය සහ එම තෙල් සමාගම් අතර ඇති කර ගනු ලැබූ එකඟවීම් ක්‍රියාත්මක කිරීම පිණිසත් එයට සම්බන්ධ හෝ ආනුෂංගික කරුණු සඳහා විධිවිධාන සැලසීමත් පිණිස වූ පනතකි.

**(සම්මතවූ දිනය: 1965 දෙසැම්බර් 18)**

1. මේ පනත 1965 අංක: 19 දරන ලංකා ඛනිජ තෙල් (විදේශික හිමිකම් පෑම්) වන්දි පනත යනුවෙන් හැඳින්විය හැකිය.

2. (1) (මේ පනත නොවන) යම් ලිඛිත නීතියක විධිවිධාන වල මෙයට පටහැනිව කුමක් සඳහන් ව ඇතත් මේ පනත අදාළ වන එක් එක් ඛනිජ තෙල් වන්දි එකඟවීම ලංකාවේ නීතියෙහි බලයෙන් සහ බල-පෑමෙන් යුක්තව පැවැති ලෙසත් පවතින ලෙසත්, උචිත දිනයෙහි සහ ඉන් පසු සැලකිය යුතුය.

තව ද ඒ අනුව,—

(අ) ඒ එකඟවීම සහ එයට සම්බන්ධ සියලු ලියවිලි රජය වෙනුවෙන් අත්සන් කිරීමේ සහ ඒ එකඟවීමට ඇතුලත් වීමේ සහ එය ක්‍රියාත්මක කිරීමේ කාර්යය සඳහා අවශ්‍ය විය හැකිව තිබුනු සහ අවශ්‍ය විය හැකි සියළු ක්‍රියා හෝ දේවල් කර තිබීමේ හෝ කිරීමේ බලය සහ අධිකාරය මුදල් ඇමතිවරයාට හෝ ඒ වෙනුවෙන් ඒ ඇමතිවරයා විසින් බලය පවරනු ලැබූ යම් තැනැත්තකුට තිබුනු ලෙස සහ තිබෙන ලෙස සියළු කල්හි ම සැලකිය යුතුය.

(ආ) එම කාර්යය සඳහා අවශ්‍ය විය හැකිව තිබුනු හා අවශ්‍ය විය හැකි සියළු ක්‍රියා හෝ දේවල් ඒ නීතිගත සංස්ථාව වෙනුවෙන් කර තිබීමේ හෝ කිරීමේද, විශේෂයෙන්, එහෙත් මෙම ඡේදයේ ඉහත දක්වුණු විධිවිධාන වල සාමාන්‍යත්වයට හානියක් නොමැතිව, ඒ ගිවිසුම යටතේ එම නීතිගත සංස්ථාව විසින් ගෙවනු ලැබීමට සැලැස්වූ සියළු මුදල් ඒ නීතිගත සංස්ථාවෙහි අරමුදල් වලින් ගෙවනු ලැබ තිබීමේ සහ ගෙවීමේ ද බලය සහ අධිකාරය ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවට හෝ ඒ සඳහා එම සංස්ථාව විසින් බලය පවරනු ලැබූ එහි නිලධරයන්ගෙන් හා සේවක-යන්ගෙන් යම් කෙනෙකුට, තිබුනු ලෙස සහ තිබෙන ලෙස සියළු කල්හි ම සැලකිය යුතුය.

(ඇ) ඒ එකඟවීමෙහි විෂය කරුණු වූ වත්කම් වලින් කිසිවක් පිළිබඳ වන්දි සඳහා වූ යම් හිමිකම් පෑමක් විභාග කිරීමේ හෝ නිශ්චය කිරීමේ යම් බලයක් අධිකාරයක් හෝ අධිකරණ බලයක් ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථා පනතෙහි විධිවිධාන යටතේ පිහිටුවනු ලැබූ හෝ සංස්ථාපනය කරනු ලැබූ වන්දි විනිශ්චය සභාවට නොතිබුණු ලෙස සහ නොමැති ලෙස සියළු කල්හි ම සැලකිය යුතු අතර, එවැනි යම් ඉල්ලීමක් එම දිනයෙහි දී කෙළවර වූ ලෙස සියළු කාර්යයන් සඳහා සැලකිය යුතුය.

(ඇ) ආපසු දෙන මෙන් ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව විසින් හෝ එය වෙනුවෙන් ඉල්ලුම් කරනු ලැබූවිට ඒ එකඟවීමෙහි විෂය කරුණු වූ වත්කම් අතුරෙන් කිසිවකට අදාල වූත් වන්දි විනිශ්චය මණ්ඩලයේ ආරක්ෂක භාරයේ ඇත්තා වූත් සියළු නීත්‍යානුකූල ලේඛන හෝ ලේඛන ආපසු දී තිබීම සහ ආපසු දීම වන්දි විනිශ්චය සභාවේ සභාපති ගේ හෝ ලේකම් ගේ යුතුකම ව පැවැති බව සහ පවතින බව සියළු කල්හි ම සැලකිය යුතුය;

(ඉ) ඒ එකඟවීමේ විධිවිධාන සලසා ඇති සියළු කරුණු සම්බන්ධයෙන් රජය ද ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව ද ඒ එකඟවීමෙහි පාර්ශ්වයක් වූ විදේශික-සතු ඛනිජ තෙල් සමාගම ද ඒ එකඟ-වීමෙන් බැඳී සිටි ලෙස සහ බැඳී සිටින ලෙස එම දිනයෙහි සහ ඉන් පසු සැලකිය යුතුය;

(ඊ) ඒ එකඟවීමෙහි විෂය කරුණු වූ වත්කම් වලින් යමක් කෙරෙහි හෝ සම්බන්ධයෙන් වූ ඒ විදේශික-සතු සමාගමෙහි යම් අයිති-යක්, හිමිකමක් හෝ සම්බන්ධතාවයක් ඒ නීතිගත සංස්ථාවට පවරා සතු කොට දෙනු ලැබ ඇති ලෙස එම දිනයෙහි සහ ඉන් පසු සැලකිය යුතුය ;

තවද,

(උ) රජය සහ ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව විසින් ඒ එකඟවීම සම්පූර්ණයෙන් ක්‍රියාත්මක කිරීම, එම ගිවිසුමෙහි විධි-විධාන සලසා ඇති සියළු කරුණු පිළිබඳ සම්පූර්ණ සහ අවසාන බේරුම් කිරීමක් වූ බව සහ විය යුතු බව එම දිනයෙහි සහ ඉන් පසු සැලකිය යුතුය.

(2) මුදල් ඇමතිවරයා විසින්, ගැසට් පත්‍රයෙහි පළ කරනු ලබන සාමාන්‍ය හෝ විශේෂ ආඥාවක් මගින්, විශේෂයෙන් මේ පනත ආරම්භවීමට පෙරාතුව වූ කාල සීමාවන් සම්බන්ධයෙන්, එම ආඥාව බල පැවැත්විය යුතු බවට, එහෙත්, මෙම උපවගන්තියේ, ඉහත දක්වුණු විධිවිධාන වල සාමාන්‍යත්වයට හානියක් නොවන පරිදි, මෙම පනතට අදාළ වන එක් එක් ඛනිජ තෙල් වන්දි එකඟවීම සම්පූර්ණයෙන් ක්‍රියාත්මක කිරීමේ කාර්යය සඳහා අවශ්‍ය විය හැකි විධිවිධාන පැනවිය හැකිය.

(3) මේ වගන්තියෙහි ඉහත දක්වුනු විධිවිධාන යටතේ පනවනු ලැබූ සෑම ආඥාවක් ම එකී ආඥාව ගැසට් පත්‍රයේ පළ කළ දින සිට බලපැවැත්විය යුතු අතර, එසේ පළ කිරීමෙන් පසු, අනුමැතිය ලබා ගැනීම සඳහා අවකාශ ඇති වහා ම, නියෝජිත මන්ත්‍රී මණ්ඩලයට ඉදිරිපත් කළ යුතුය. එසේ අනුමතිය ලැබූ සෑම අඥාවකට ලංකාවේ නීතියෙහි බලය සහ බලපෑම තිබිය යුතු අතර, ඒ අනුව, මෙහිලා පනවනු ලැබ ඇත්තාක් මෙන් එය වලංගු ද, බලපවත්වනු ද විය යුතුය. එසේ අනුමත කරනු නොලැබූ කුමන හෝ එබඳු අඥාවක්, ඒ යටතේ ඉහත දී කරන ලද කුමක හෝ වලංගු බවට හානියක් නොවන පරිදි, එකී ආඥාව අනුමත නොකළ දින සිට අවලංගු කළ ලෙස සැලකිය යුතුය.

3. ලංකා ඛණිජ තෙල් නීතිගත සංසථාව විසින් ගෙවන ලෙස මේ පනතෙහි ඉහත දක්වුණු විධිවිධාන යටතේ වූ ආඥාවක් මගින් මුදල් ඇමතිවරයා විසින් නියම කරනු ලැබුවහොත් මිස සහ එසේ එකී නීතිගත සංසථාව විසින් ගෙවනු ලැබුව

හොත් මිස, මේ පනත අදාළ වන යම් ඛනිජ තෙල් වන්දි එකඟවීමක් යටතේ රජය විසින් ගෙවිය යුතු වන සියළු මුදල් ලංකාවේ ඒකාබද්ධ අරමුදලේ කළ යුතු අය කිරීමක් ලෙස මෙයින් පනවනු ලැබේ.

4. එක් අතකින් මේ පනතේ හා මේ පනත අදාළ වන යම් ඛනිජ තෙල් වන්දි එකඟවීමක විධිවිධාන සහ වෙන යම් ලිඛිත නීතියක විධිවිධාන අතර ගැටුමක් හෝ පරස්පර විරෝධී බවක් ඇති වූ විටක, පළමුවෙන් සඳහන් විධිවිධාන ඒ වෙනත් ලිඛිත නීතියේ විධිවිධාන අභිභවා පැවැතිය යුතු අතර, ඒ අනුව ඒ වෙනත් ලිඛිත නීතිය ඒ පළමුවෙන් සඳහන් විධිවිධාන වලට යටත්ව කියවා තේරුම් ගත යුතුය.

එසේ වුවද, ගෙවිය යුතු වන්දි මුදල නිගමනය කිරීමේ දී සාධාරණ වෙළෙඳ වටිනාකම් පිළිබඳ මූල ධර්ම අදාළ විය යුත්තේ මෙම පනත අදාළ වන්නා වූ ඛනිජ තෙල් වන්දි එකඟත්වයට පමණය.

5. මේ පනතේ පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වුවහොත් මිස,—

"වත්කම්" යන්නෙන් ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථා පනතේ අර්ථය තුළ වූ යම් නිශ්චල දේපළක් අදහස් වන අතර, යම් චංචල දේපළක් ද එයට ඇතුළත් වේ;

"ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව" යන්නෙන් ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථා පනත යටතේ පිහිටුවන ලද ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව අදහස් වේ;

"ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථා පනත" යන්නෙන් 1963 අංක: 5 දරන ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථා (සංශෝධන) පනතින් සහ ඊට පසුව වූ යම් පනතකින් සංශෝධිත 1961 අංක: 28 දරන ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථා පනත අදහස් වේ;

"වන්දි විනිශ්චය සභාව" යන්නෙන් ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථා පනත යටතේ සංස්ථාපිත වන්දි විනිශ්චය සභාව අදහස් වේ.

"විදේශික-සතු ඛනිජ තෙල් සමාගම්" යන්නෙන්,—

(අ) සාමාන්‍යයෙන් "ෂෙල්" යනුවෙන් හැඳින්වෙන, එනම්, එක්සත් රාජ්‍යයේ, ලංඩන් එස්. ඊ. 1 ෂෙල් සෙන්ටර්හි තම ලියාපදිංචි කළ කාර්යාලය ඇති, එංගලන්තයේ නීති යටතේ නීතිගත සීමා සහිත ලංකාවේ ෂෙල් සමාගම;

(ආ) සාමාන්‍යයෙන් "එසෝ" යනුවෙන් හැඳින්වෙන, එනම්, ඇමෙරිකා එක්සත් ජනපදයේ නිව්යෝර්ක්හි බටහිර 51 වැනි වීථියේ අංක: 15 දරන ස්ථානයේ තම කාර්යාලයක් සහ කොළඹ බේලි වීථියේ ස්ටේට් බැංකු ගොඩනැගිල්ලෙහි ලියාපදිංචි කළ කාර්යාලයක් ලංකාවේ ඇති, ඇමෙරිකා එක්සත් ජනපදයෙහි ඩෙලවෙයාර් ජනපදයේ නීති යටතේ නීතිගත, සංස්ථාපිත එසෝ ස්ටෑන්ඩර්ඩ් ඊස්ටර්න්, සහ

(ඇ) සාමාන්‍යයෙන් "කැල්ටෙක්ස්" යනුවෙන් හැඳින්වෙන, එනම්, ලංකාවේ කොළඹ ගෝල්ෆේස් කෝට් හි අංක: 25 දරන ස්ථානයෙහි තම ලියාපදිංචි කළ කාර්යාලය ඇති, ලංකාවේ නීති යටතේ නීතිගත සීමා සහිත ලංකා කැල්ටෙක්ස් - අදහස් වෙති.

"මේ පනත අදාළ වන ඛනිජ තෙල් වන්දි එකඟවීම්" යන්නෙන් රජය වෙනුවෙන් මුදල් ඇමතිවරයා සහ විදේශ-සතු ඛනිජ තෙල් සමාගම් අතර එක්දහස් නවසිය හැට පහේ ජූනි මස විසි දෙවැනි දින කර ගන්නා ලදුව, උත්තර මන්ත්‍රී මණ්ඩලය සහ නියෝජිත මන්ත්‍රී මණ්ඩලය වෙත පිටපත් ඉදිරිපත් කර ඇති වන්දි එකඟවීම් අදහස් වන අතර, "ඛනිජ තෙල් වන්දි එකඟවීම" යන යෙදුම ඒ අනුව තේරුම් ගත යුතුය;

"උචිත දිනය" යන්නෙන් එක්දහස් නවසිය හැට පහේ ජූනි මස විසි දෙවන දිනය අදහස් වේ.

චක්‍ර ලේඛ අංක: 20

ශ්‍රී ලංකා මහ බැංකුව,
තැ. පෙ. 590,
කොළඹ.
1965 මැයි 27 වෙනි දින.

## අත්තිකාරම් සඳහා මහ බැංකු පොළී අනුපාතිකය

(මුදල් නීති පනතේ 83 සහ 87 වැනි වගන්ති සම්බන්ධවයි)

1. 1965 මැයි 28 වෙනි දින සිට රජය විසින් ඔඩපිත හා රජය විසින් ඇප වූ සුරැකුම්පත් ඇපයට තබා මහ බැංකුවෙන් වෙළෙඳ බැංකු වලට දෙන අත්තිකාරම් සඳහා පොළී අනුපාතිකය වර්ෂයකට සියයට 5 ක් විය යුතු ය.

2. 1965 මැයි 28 වෙනි දින සිට වාණිජ හා නිෂ්පාදන ණය සඳහා වූ භාවිතීය පොරොන්දු නෝට්ටු ඇපයට තබා මහ බැංකුවෙන් වෙළෙඳ බැංකු වලට දෙන අත්තිකාරම් සඳහා පොළී අනුපාතිකය වර්ෂයකට සියයට 5 ක් විය යුතුය.

3. 1961 ජනවාරි 26 වැනි දින හා අංක 12 දරන චක්‍ර ලේඛය මෙයින් ඉවත් කරගනු ලැබේ.

එස්. ඩී. අමරසිංහ
ප්‍රධාන ගණකාධිකාරි
ශ්‍රී ලංකා මහ බැංකුව

ඩී. ඩබ්ලිව්. රාජපතිරාන
අධිපති
ශ්‍රී ලංකා මහ බැංකුව

<u>චක්‍ර ලේඛ අංක: 21</u>

ශ්‍රී ලංකා මහ බැංකුව,
කොළඹ.
1965 ජූනි 21.

## වෙළෙඳ බැංකු ණය

පසුගිය වසර කීපයෙහි, පෞද්ගලික අංශයට දෙනු ලැබූ වෙළෙඳ බැංකු ණය බොහෝ සෙයින් ප්‍රසාරණය වෙමින් පැවතිණි. මෙම වර්ෂයේ මුල් කාර්තුවේ ද මේ හැඩගැස්ම, නොවෙනස්ව පැවැතිණි. ඉදිරි මාස 12 තුළ බැංකු ණය ප්‍රසාරණය ක්‍රමාන්විත කරනු සඳහා 1966 ජූනි 15 වැනිදයින් ඇරඹෙන මාස 12 තුළ පෞද්ගලික අංශයට (රජයේ සමායතන ඇතුළුව) දෙන ණය වැඩිවීම වෙළෙඳ බැංකු විසින් සීමා කිරීම අවශ්‍යයැයි මහ බැංකුව තීරණය කොට ඇත. මේ කාලය තුළදී බැංකුවල අත්තිකාරම් වැඩිකළ හැකි ප්‍රමාණය ගැන ඒ ඒ බැංකුවලට වෙන වෙනම දන්වනු ලැබේ. මේ චක්‍ර ලේඛයේ අවශ්‍යතා සඳහා 'අත්තිකාරම්' යන්නෙන්, පහත දැක්වෙන වෙළෙඳ බැංකු වත්කම් ශීර්ෂ ගැනේ.

ණය
අයිරා
මුදල් දෙන ලද ආනයන බිල්
මුදල් දෙනලද දේශීය බිල්

**එස්. ඩී. අමරසිංහ**
ප්‍රධාන ගණකාධිකාරී

**ඩී. ඩබ්ලිව්. රාජපතිරාන**
අධිපති

<u>චක්‍රලේඛ අංක: 22</u>

ශ්‍රී ලංකා මහ බැංකුව,
තැ. පෙ. 590,
කොළඹ 1.
1965 නොවැම්බර් 23 වැනි දින.

## වෙළෙඳ බැංකු ණය

1960 අගෝස්තු 12 වැනි දින හා අංක: 11 දරන අපගේ චක්‍රලේඛයේ සඳහන් පහත දැක්වෙන විධිවිධාන, අද දින සිට ඉවත් කරගනු ලැබේ:—

(අ) ණයවර ලිපි වෙනුවෙන් වූ ආන්තික අවශ්‍යතා.

(ආ) චක්‍රලේඛයේ 'අ' උපලේඛනයෙන් නියම කැරුන භාණ්ඩ, ලංකාවට ආනයනය කිරීමට මුදල් යෙදවීම සඳහා වන, වෙළෙඳ බැංකු ණය පිළිබඳ (ආ) වගන්තියේ 1 වැනි ඡේදය.

එස්. බී. අමරසිංහ
ප්‍රධාන ගණකාධිකාරී
ශ්‍රී ලංකා මහ බැංකුව.

ඩී. ඩබ්ලිව්. රාජපතිරාන
අධිපති
ශ්‍රී ලංකා මහ බැංකුව.